# UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ප්‍රථම වසර පරීක්ෂණය (බාහිර) නව නිර්දේශය - 2017
(2017 - අප්‍රේල්)

කාලය පැය 03 යි

ඉතිහාසය

## HISE 101 ක්‍රි.ව. 1500 දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මඟින් පහදන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.
මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව අට (08) කි.

1. පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීම සඳහා අභිලේඛනවල ඇති වැදගත්කම පහදන්න.

2. "දිවයින මුල් වරට එක්සත් වූයේ දුට්ඨගාමණී පාලන සමයේදීය" විමසන්න.

3. "පුරාතන ශ්‍රී ලාංකිකයෝ විදේශ වෙළෙඳාමට කුසීත වූහ." විචාරාත්මකව සාකච්ඡා කරන්න.

4. අනුරාධපුර යුගයෙහිදී රජු සහ භික්ෂූන් වහන්සේලා අතර පැවති සබඳතාව සැකෙවින් සමාලෝචනය කරන්න.

5. රජරට ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්තයෙහි අනුක්‍රමික වර්ධනය එහි තාක්ෂණික අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට පහදන්න.

6. පළමු වැනි පරාක්‍රමබාහු රජුට මුහුණදීමට සිදු වූ අභියෝග පැහැදිලි කොට ඔහු ඒවා ජය ගැනීමට සමත් වූ ආකාරය විභාග කරන්න.

7. අදාළ කාලපරිච්ඡේදයෙහි ශ්‍රී ලංකාව දකුණු ඉන්දියාව සමඟ පැවැත් වූ සංස්කෘතික සබඳතා සාකච්ඡා කරන්න.

8. ගම්පළ යුගයේ කලා හා ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳව විචාරාත්මක විග්‍රහයක් කරන්න.